www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් -- 10 වන කොටස

## The Historical and International Foundations of the Socialist Equality Party—Part 10

*එක්සත් ජනදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් ලියවිල්ල කොටස් වසයෙන් පල කිරීම අපි ආරම්භ කර ඇත්තෙමු. පසුගිය අගෝස්තු 3-9 දිනවල පැවති සසප ආරම්භක සම්මේලනයේ දී මෙම ලියවිල්ල පුලුල් ලෙස සාකච්ඡා කරනු ලැබ ඒකමතිකව සම්මත කර ගන්නා ලදි. සම්මේලනයේ දී සම්මත කෙරුනු සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ද මීට පෙර ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පල විය.*

### භේදයෙන් පසු-භූගෝලීයකරනයේ වැදගත්කම හා ඇගවුම්

202. භේදයෙන් පසු ආසන්න කාලය තුල ජාත්‍යන්තර කමිටුව, කම්කරු විප්ලවවාදී පක්ෂය දියකර හැරීම මාතෘකා කොට ගත් සවිස්තරාත්මක විශ්ලේෂනයකට අතගැසී ය. 1973-1985 අතර කාලයේ කම්කරු විප්ලවවාදී පක්ෂය ට්‍රොට්ස්කිවාදය පාවා දුන්නේ කෙසේද? කෘතිය පෙන්නුම් කලේ, සංවිධානය තුල අර්බුදය, ජාත්‍යන්තර කමිටුව ගොඩනැගීමේ දී බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදීන් විසින් ආරක්ෂා කල මූලධර්මවලින් පසුබැසීමත්, පසුව 1963 දී, එස්ඩබ්ලිව්පී විසින් ගෙන ගිය පැබ්ලෝවාදීන් සමග මූලධර්ම විරහිත යලි එකමුතුවීමට එරෙහි අරගලයෙන් ඔවුන්ගේ පසුබැසීමත් සමග බැඳී තිබුනු බවය. ඉන් පසුව ජාත්‍යන්තර කමිටුව, ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ඉතිහාසයට මයිකල් බන්ඩා එල්ල කල ප්‍රහාරය කෙරේ අවධානය යොමුකල අතර, ඩේවිඩ් නෝර්ත් විසින් ලියන ලද '*අප රක්නා උරුමය-හතරවන ජාත්‍යන්තරයේ ඉතිහාසයට එකතු කිරීමක්*' කෘතිය පලකලේය.□

203. ජාත්‍යන්තර කමිටුවේ භේදයෙහි ඓතිහාසික මූලයන් හා දේශපාලන සම්භවය පිලිබඳ විශ්ලේෂනයෙන් පසුව කමිටුව, හතර වන ජාත්‍යන්තරය ගොඩනැගෙන පන්ති අරගලයේ වර්ධනය සඳහා වෛෂයික පදනම් සම්පාදනය කරන ලෝක ආර්ථිකයේ වෙනස්කම් පිලිබඳ ක්‍රමානුකූල විශ්ලේෂනයකට අත ගැසීය. 1987 ජූලි මාසයේ ජාත්‍යන්තර කමිටුවේ සිව්වන පුන් සැසිය තුල පහත සඳහන් ප්‍රශ්න මතු කලේය. 1.) හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ වර්ධනයෙහි ලා සවිඥානක ප්‍රකාශනයක් අත් කර ගන්නේ ලෝක ආර්ථික හා දේශපාලන වර්ධනයේ කවර නම් නව ප්‍රවනතාවන්ද? 2) නව ලෝක විප්ලවවාදී අර්බුදයක් වැඩී යා හැකි යයි අපේක්ෂා කල හැක්කේ කුමන පදනමක් මතද?□

204. මෙම ප්‍රශ්නවලට පිලිතුරු සැපයීමේ දී හජාජාක සිය මූලික අවධාරනය යෙදුවේ "අන්තර්ජාතික සංගතයන්ගේ ක්‍රියාකාරිත්වයෙහි පුපුරන සුලු වර්ධනය" මතය. එය මෙසේ සඳහන් කලේ යː

> ප්‍රතිඵලය වූයේ පෙර නො දුටු විරූ ලෙස ලෝක වෙලඳපොල සංකේන්ද්‍රනය වීමක්, නිෂ්පාදනය ජාත්‍යන්තරීකරනය වීමක් ය. එක්සත් ජනපදය ද ඇතුලු සියලු ජාතික ආර්ථිකයන් මත, ලෝක ආර්ථිකයේ නිරපේක්ෂ හා ක්‍රියාකාරී ආධිපත්‍යය නූතන ජීවිතයේ මූලික සාධකයකි. ඒකාබද්ධ පරිපථ ක්ෂේත්‍රයේ නව සොයාගැනීම් හා පරිපූර්නත්වයට පත්කිරීම් සමග බැඳුනු තාක්ෂනයේ වර්ධනය මගින්, සන්නිවේදනයෙහි විප්ලවවාදී වෙනස්කම් ඇති කෙරුනු අතර, එය පෙරලා ලෝක පරිමාන ආර්ථික සංකේන්ද්‍රනයේ සන්තතිය වේගවත් කර ඇත. නමුත් මෙම ආර්ථික හා තාක්ෂනික වර්ධනය, ධනපති ක්‍රමයට ඓතිහාසික මාවත් පාදනවා වෙනුවට ලෝක ආර්ථිකය හා ධනපති ජාතික රාජ්‍ය පද්ධතිය ද, සමාජයීය හා පෞද්ගලික අයිතිය ද අතර මූලික පරස්පර විරෝධයන් ඓතිහාසිකව පෙර නො වූ විරූ ආතති සහගත මට්ටමකට ඔසවා තබා ඇත. [116]

205. ජාත්‍යන්තර කමිටුව මෙසේ ද පැවසීය.

> දැවැන්ත අන්තර්ජාතික සංගත හා නිෂ්පාදනය පෘථිවි ගෝලීය පරිමාන වීමේ ප්‍රපංචය, ගැඹුරු විප්ලවවාදී ගම්‍යයන් ඇති තවත් සාධකයක් සමග අවියෝජනීය ලෙස බැඳී ඇතː එනම්, සාපේක්ෂ හා පරම වශයෙන් ම ලෝක ආර්ථික ආධිපත්‍යය එක්සත් ජනපදයට අහිමි වී යාම ය. එක්සත් ජනපදය ලොව ප්‍රමුඛ නය දෙන්නාගේ තැනෙහි සිට

ලොකුම නය ගැතියා බවට පරිවර්තනය වීම ප්‍රකාශයට පත් කල එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ලෝක තත්වයෙහි සිදුව ඇති ඓතිහාසික වෙනස, කම්කරුවන්ගේ ජීවන තත්වයන්හි නාටකාකාර පරිහානියට යටින් පවත්නා හේතුවයි. මේ තත්වය එක්සත් ජනපදය තුල විප්ලවකාරී පන්ති ගැටුම්වල අවධියකට දොර විවර කරනු ඇත.[117]

206. දෙවන ලෝක යුද්ධ පර්යායේ බිඳවැටීම මූර්තිමත් කරන, ජාත්‍යන්තර කමිටුවේ අවධානයට ලක් වූ තවත් වර්ධනයක් නම්, අන්තර් අධිරාජ්‍යවාදී කා කොටා ගැනීම් උග්‍රවීමයි. එවකට ජපානයේ වේගවත් ආර්ථික වර්ධනය, කිසිදු ආකාරයකින් පරම දෙය නොවූවත්, මෙම නව ආතතීන් පිලිබඳ වඩාත් සමීප මූලය විය. ඇමරිකානු හා ජපන් ප්‍රාග්ධනයට අභියෝග කල හැකි ඒකාබද්ධ යුරෝපිය වෙලඳපොලක් පිහිටුවීමේ සැලසුම් ක්‍රියාවට නැගීම කෙරෙහි ද හජාජාක අවධානය යොමු කලේය. ඉහල ලාභානුපාතිකයක් හඹාගිය ජාත්‍යන්තර ප්‍රාග්ධන අපනයනයේ ප්‍රතිපල වශයෙන් ආසියාව, අප්‍රිකාව හා ලතින් ඇමරිකාව තුල කම්කරු පන්තියේ ඉමහත් ප්‍රසාරනයේ විප්ලවීය වැදගත්කම ද හජාජාක විසින් සලකා බැලීය.

207. අන්තර් ජාතික සංගතවල දැවැන්ත වර්ධනයත් එහි ප්‍රතිඵලය වූ ධනවාදී නිෂ්පාදනයේ පෘථිවි ගෝලීය සංකේන්ද්‍රනයත් විසින්, ජාතික රාජ්‍ය පද්ධතිය වැලඳගත් සමාජ හා දේශපාලන සංවිධානවල ශක්‍යතාවට නාටකාකාර ලෙස වලකැපුනි. ධනවාදයේ ගෝලීය ඒකාග්‍රකරනය. කම්කරු පන්තියේ ඒකාබද්ධතාව සඳහා වෛෂයික කොන්දේසි නිර්මානය කරනු ලැබුව ද, මෙම විප්ලවකාරී ශක්‍යතාව, ජාත්‍යන්තර මූලෝපායක් මත පදනම් වූ සංවිධාන හා නායකත්වයකට කැඳවුම් කරන අතර, එවන් නායකත්වයකින් තොරව කම්කරු පන්තියට ජාත්‍යන්තරව සංවිධානය වූ ප්‍රාග්ධනයට එරෙහිව ආරක්ෂා වී ගත නොහැකිය. *ලෝක ධනේශ්වර අර්බුදය හා හතරවන ජාත්‍යන්තරයේ තර්තව්‍යයෝ නම් වූ, 1988 ඉදිරිදර්ශන* ලියවිල්ල තුල හජාජාක පැහැදිලි කල පරිදි-

> අන්තර් ජාතික සංගතවල දැවැන්ත වර්ධනයත් එහි ප්‍රතිඵල වන ධනවාදී නිෂ්පාදනයේ පෘථිවි ගෝලීය සංකේන්ද්‍රනයත් විසින්, ලෝකයේ කම්කරුවන් මුහුන දී සිටින කොන්දේසිවල පෙර නුවූ විරූ සාම්‍යයක් ඇති කර තිබේ. ධනපතියන්ගේ ජාතික කන්ඩායම් අතර ලෝක වෙලඳපොලෙහි අධිකාරය සඳහා වන රුදුරු තරගය, එහි කුරිරුම ප්‍රකාශනය අත් කර ගන්නේ "තමන්ගේ ම" රටවල් තුල කම්කරු පන්තිය සූරාකෑම තීව්‍ර කිරීමෙහි ලා පාලක පන්තීන් ගෙන යන ව්‍යාපාරය තුලය. රටක් රටක් පාසා ශ්‍රමයට එරෙහිව ප්‍රාග්ධනයේ ප්‍රහාරය පෘථුල විරැකියාව, වැටුප් කැපීම්, වැඩ වේගවත් කිරීම්, සමිති බිඳීම්, සමාජ සහන කප්පාදු කිරීම්, සහ ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එරෙහිව තීව්‍රතර පහර එල්ල කිරීම් මගින් ක්‍රියාවට නැගෙයි.[118]

208. ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයේ ඇතිවූ වෙනස්කම් සමඟ පන්ති අරගලයේ රූපය ද වෙනස් විය.

> සාරය වශයෙන් ජාත්‍යන්තර වන පන්ති අරගලය ජාතික වන්නේ එහි රූපයෙන් පමනක්ය යන්න මාක්ස්වාදයේ චිරකාලීන ප්‍රස්තුතයකි. කෙසේ වතුදු, ධනවාදී වර්ධනයේ නව අංග ලක්ෂන අනුව පන්ති අරගලයේ රූපය පවා ජාත්‍යන්තර ස්වභාවයක් ගත යුතු වේ. කම්කරු පන්තියේ අති මූලික අරගලයන් පවා ඒවායේ කටයුතු ජාත්‍යන්තර පරිමාවකින් සම්බන්ධීකරනය කිරීමේ අවශ්‍යතාව මතු කරයි. අන්තර්ජාතික සංගත විසින් නිපදවන භාන්ඩයක් සඳහා රටවල් ගනනාවක කම්කරුවන්ගේ ශ්‍රම ශක්තිය සූරා කෑමත්, ඉහල ම ලාභ රේට්ටුව සොයා විවිධ රටවල හා විවිධ මහාද්වීපවල පිහිටි සිය නිෂ්පාදනාගාර අතර නිෂ්පාදනය බෙදා හැරීම සහ මාරු කිරීමත්, ආර්ථික ජීවිතයේ මූලික සාධකයකි. මේ අනුව ප්‍රාග්ධනයේ පෙර නුවූ විරූ ජාත්‍යන්තර සංචලනය විවිධ රටවල කම්කරු ව්‍යාපාරය සම්බන්ධයෙන් සියලු ජාතික ක්‍රියාමාර්ගයන් යල්පිනූ හා අතිශයින් ප්‍රතිගාමී බවට පත් කර ඇත. [119]

හජාජාක වර්ධනය අවශ්‍යයෙන්ම බැඳී තිබුනු වෛෂයික පදනම සැදුම් ලද්දේ හරියට ම මෙම වර්ධනයන් ගෙනි. මෙම කාරනය 1988 අගෝස්තුවේ පැවති වර්කර්ස් ලීගයේ 13 වන ජාතික සමුලුවට ඉදිරිපත් කල වාර්තාව තුල පොහොසත් කර අවධාරනය කරන ලදී.

> නිර්ධන පන්ති අරගලයේ ඊලඟ අදියර, වෛෂයික ආර්ථික ප්‍රවනතාවන්ගේ ද, මාක්ස්වාදීන්ගේ ආත්මීය බලපෑමේ ද ඒකාබද්ධ තල්ලුව යටතේ ජාත්‍යන්තර පරාවක්‍රයක් දිගේ නිර්දය ලෙස වැඩෙනු ඇතැයි අප පරිකල්පනය කරන්නෙමු. භාවිතයේ දී නිර්ධන පන්තිය, තමන් ජාත්‍යන්තර පන්තියක් ලෙස අනන්‍ය කර ගැනීමට වඩ වඩාත් යොමුවනු ඇත. මෙම ඓන්ද්‍රීය ප්‍රවනතාවේ ප්‍රකාශනය වන මාක්ස්වාදී ජාත්‍යන්තරවාදීන්ගේ ප්‍රතිපත්ති, එම ක්‍රියාවලිය පෝෂනය කර එයට සවිඥානක රූපයක් ලබාදෙනු ඇත. [120]

209. ගෝලීය නිෂ්පාදනයේ නව රූපාකරයන්, ලෝක යුද්ධයේ තර්ජනය හීනකරනවාට වඩා එය උත්සන්න කරනු ඇතැයි ජාත්‍යන්තර කමිටුව අනතුරු ඇඟවීය.

ධනේශ්වර නිෂ්පාදනයේ ගෝලීය ස්වභාවය, ප්‍රධාන අධිරාජ්‍යවාදී බලවතුන් අතර ආර්ථික හා දේශපාලන ප්‍රතිසතිතා ඉමහත් ලෙස තියුනු කර ඇත. එමඟින් යලි වතාවක් ලෝක ආර්ථිකයේ වෛෂයික වර්ධනයත්, සමස්ත ධනේශ්වර දේපල පද්ධතිය මුල්බැස තිබෙන ජාතික රාජ්‍ය ආකෘතියත් අතර සමහන්කල නොහැකි ප්‍රතිවිරෝධතා පෙරමුනට පමුනුවා ඇත. කිසිදු ධනපති " පීතෘභූමියකට" බන්ධනගතව නැති නිර්ධන පන්තියේ සුපැහැදිලි ජාත්‍යන්තර ස්වභාවය නිසා, ජාතික රාජ්‍ය පද්ධතියේ විලංගුවෙන් ශිෂ්ඨාචාරය විමුක්ත කර ගැනීමට හැකි එකම සමාජ බලවේගය බවට එය පත් කරයි.

මෙම ප්‍රාථමික කාරනා හේතු කොට ගෙන, ධනේශ්වර පද්ධතියට එරෙහිව, ජාත්‍යන්තර පරිමාන නිර්ධන පන්ති රාශිකරනයක් අරමුනු කරගත් ජාත්‍යන්තර මූලෝපායක් මත පදනම් නොවන්නේ නම්, කිසිදු රටක පාලක පන්තියකට එරෙහිව කිසිදු අරගලයකින් කම්කරු පන්තියට, එහි අවසාන විමුක්තිය කෙසේ වෙතත්, කල් පවත්නා ජයග්‍රහනවත් අත්කර නොදෙනු ඇත. කම්කරු පන්තියට මෙම අවශ්‍ය එකමුතුව අත් කර ගත හැක්කේ, අව්‍යාජ ජාත්‍යන්තර නිර්ධන පන්තික, එනම් විප්ලවවාදී පක්ෂයක් ගොඩනැඟීමෙන් පමනි.

දශක ගනනාවක අශමනීය දෘෂ්ටිවාදාත්මක හා දේශපාලන අරගලයක නිමැවුමක් වූ එවන් එකම පක්ෂයක් පවතියි. ඒ, 1938 ලියොන් ට්‍රොට්ස්කි විසින් ගොඩනගන ලද, අද ජාත්‍යන්තර කමිටුව විසින් නායකත්වය දෙන හතරවන ජාත්‍යන්තරය යි. [121]

## සෝසසසං තුල පෙරෙස්ට්‍රොයිකා හා ග්ලස්නොස්ට්

210. 1982-86 අතර ජාත්‍යන්තර කමිටුව තුල අර්බුදය දිග හැරුනේ, සෝවියට් සංගමයේ හා එහි ස්ටැලින්වාදී තන්ත්‍රයේ ගැඹුරුවන අර්බුදයක පසුබිමෙහි ය. දෙවන ලෝක යුද්ධයෙන් ඉක්බිත්තේ හටගත්, සෝවියට් ආර්ථිකයේ ඉමහත් වර්ධනයක පරස්වාචකයක් ලෙස, මෙම අර්බුදය වර්ධනය විය. මෙම ප්‍රසාරනය, "තනිරටක සමාජවාදය" පිලිබඳ ස්ටැලින්වාදී ඉදිරිදර්ශනය මත පදනම්වූ ජාතික ස්වයංපෝෂනයේ ආර්ථික පිලිවෙත් තව දුරටත් කාබාසිනියා කලේය. වඩ වඩාත් සංකීර්නත්වයට පත් සෝවියට් ආර්ථිකය, ලෝක ආර්ථිකය තුලට පිවිසීමේත්, එහි ජාත්‍යන්තර ශ්‍රම විභජනයේත් අවශ්‍යතාවය ඉමහත් හදිසි බවකින් මතු කලේය. විශේෂයෙන්ම 1945 න් පසු පලමු දශක දෙකෙහි ලෝක ආර්ථික වර්ධන අනුපාතිකය පොදුවේ අත් කර ගත් ඉහල මට්ටම පිරිහෙන්නට පටන්ගත් තත්වය තුල, සෝසසසං වැඩෙන ආර්ථික ගැටලු, විද්‍යාත්මක සැලසුම්කරනය පිලිබඳ ප්‍රකාශ විකාරයක් බවට පත් කල, නිලධාරිමය කලමනාකරන ක්‍රමයේ දැඩි අකාර්යක්ෂමතාව මඟින් උත්සන්න කලේය. 1936 දී ට්‍රොට්ස්කි අවධාරනය කල පරිදි, සැලසුම්ගත ආර්ථිකයක ගුනය "නිෂ්පාදකයන්ගේ හා පාරිභෝගිකයන්ගේ ප්‍රජාතන්ත්‍රවාදයත්, ආරම්භකත්වයේ හා විවේචනයේ නිදහසත් ඉල්ලා සිටින අතර බිය, බොරුව හා ඉච්ඡාව රජයන ආඥාදායක තන්ත්‍රයක් සමඟ එය නොපෑහෙන තත්වයකි." [122] 1935 දී ට්‍රොට්ස්කි මෙසේ ද පැවසීය. "ආර්ථික කර්තව්‍යයන් වඩා සංකීර්න වත්ම, ජනගහනයේ ඉල්ලීම් හා අවශ්‍යතාවන් ද, නිලධාරි තන්ත්‍රය හා සමාජවාදී සංවර්ධනය පිලිබඳ ඉල්ලීම් ද අතර ප්‍රතිසතිකය ද තව තවත් තියුනු අතට හැරේ." [123] නිලධරයේ දේශපාලන හා සමාජ අවශ්‍යතාවන් ද, ආර්ථික සංවර්ධනයේ වෛෂයික අවශ්‍යතා ද අතර ප්‍රතිසතිකය, පරිඝනක තාක්ෂනය පිලිබඳ එම තන්ත්‍රයේ මර බිය තුල, විශේෂයෙන් ම විකෘති ලෙස ප්‍රකාශිත විය. පුරවැසියන් තමන් සතු යතුරුලියන හා මිමියොග්‍රාෆ් යන්ත්‍ර පවා ලියාපදිංචි කිරීමට නියමිතව ඇති රටක් තුල, පරිඝනක භාවිතය ව්‍යාප්ත වීමේ දේශපාලන ඇඟවුම්වලින් ස්ටැලින්වාදී අධිකාරීන් භ්‍රාන්තියට පත්වෙති.

211. සෝවියට් සංගමයේ ද, නැගෙනහිර යුරෝපයේ ද ස්ටැලින්වාදී තන්ත්‍රයන් කෙරෙහි විරෝධය, 1960 හා 1970 ගනන්වල එක එල්ලේ ඉහල නැගුනි. 1962 ජූනි මාසයේ හමුදාව විසින් ප්‍රචන්ඩ ලෙස මඩිනු ලැබූ, සෝවියට් කාර්මික නගරයක් වූ නෝවෝචර්කාස්ක්හි ප්‍රධාන වැඩ වර්ජන ගැන ප්‍රවෘති පලවිය. 1964 ඔක්තෝබරයේ දී ලියොනිඩ් බ්‍රෙෂ්නෙව් විසින්, හදිසියේ බලයෙන් පහවූ කෘෂෙව් ඌනපූරනය කිරීමත්, 1953 න් පසුව හටගත් ප්‍රති-ස්ටැලින්වාදී උද්ඝෝෂන පාගා දැමීමත්, තන්ත්‍රයේ නීති යුක්ත භාවය රඳවාගැනීමට දරන ලද මංමුලා සහගත උත්සාහයන් ය. යූලි ඩැනියෙල් හා අන්ද්‍රේ සිනියව්ස්කි යන ලේඛකයන්ගේ නඩු විභාග හා සිරගත කිරීම් ද, පසුව ඇලෙක්සැන්ඩර් සොල්ෂෙනිට්සින් පිටුවහල් කිරීමේ ද, අරමුන වූයේ තන්ත්‍රය අපකීර්තියට පත්කිරීමට බලපෑ, වැඩෙන පෙරලිකාරී ව්‍යාපාරය බියගැන්වීමයි. 1968 ජනවාරියේ ඊනියා "ප්‍රාග් නැගිටීමට" පසු චෙකොස්ලවාකියාවේ ඇලෙක්සැන්ඩර් ඩුබ්ෂෙක් බලයට පත්වීම, සෝවියට් නිලධරය තව දුරටත් බියට

පත් කලේය. ඉන් පසුව ඩුබ්ෂෙක් බලයෙන් පහකිරීමට, 1968 අගෝස්තුවේ සිදු කල චෙකොස්ලොවාකියානු ආක්‍රමනය, ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී ස්වභාවයේ ප්‍රතිසංස්කරන පිලිබඳව විශ්වාස කල සෝවියට් හා නැගෙනහිර යුරෝපීය කම්කරු පන්තියේ හා බුද්ධිමතුන්ගේ සැලකිය යුතු කොටස් අතර පරත්වාරෝපනය ගැඹුරු කලේය.

1970 පෝලන්තයේ මහා වැඩ වර්ජන, 1956 මහා විරෝධතා මධ්‍යයේ බලයට පැනගත් ගොමුල්කාගේ ම පාලනය බිඳ දැමීය. මෙම අභියෝග හමුවේ බ්‍රෙෂ්නෙව්, ඇසේ දැවටුනු පටලයක් සේ ඔහුගේ තන්ත්‍රය වෙත යොමුව සිටි මූලධර්මවාදී ස්ටැලින්වාදීන් වෙත නැඹුරු වීමට උත්සාහ කලේය. මෙම කාල වකවානුව සෝවියට් සංගමය හා එක්සත් ජනපදය අතර "සංහිඳියාව" මල්පල ගැන්වූ බවක් පෙනීයාම ද කැපී පෙනෙයි. 1970 ගනන් අවසාන භාගයේ, කාටර් පරිපාලනය වඩා ගැටුම්කාරී පිලිවෙතක් - රේගන් පරිපාලනය යටතේ තවදුරටත් වර්ධනය කල - කරා හැරීමත් සමඟ මෙම පිලිවෙත අවසන් විය.

212. 1982 නොවැම්බරයේ බ්‍රෙෂ්නෙව් මිය යන විට, තන්ත්‍රයට තවදුරටත් සැඟවිය නොහැකි වූ පොදු සමාජ පල්වීමක හා බරපතල ආර්ථික අර්බුදයක සලකුනු දක්නට ලැබුනි. බ්‍රෙෂ්නෙව්ගෙන් පසුව බලයට පත් කේජීබී අධ්‍යක්ෂකව සිටි යූරි ඇන්ඩ්‍රොපොව්, තන්ත්‍රයේ විශ්වාසනීයත්වය යලි ගොඩනැඟීම සඳහා විවිධ දූෂන විරෝධී ප්‍රතිසංස්කරන ක්‍රියාවට නැඟීමට උත්සාහ කලේය. සෝවියට් කර්මාන්තයේ පලදායිතාව වැඩිකල හැකිය යන බලාපොරොත්තුව මත ඔහු බීමත් කමට එරෙහිව ද ක්‍රියා කිරීමට පටන් ගත්තේය. එහෙත් මෙම පියවරයන් හුදෙක් පැලැස්තර ඇලවීමක් පමනකි. මූලික ගැටලුව ජාතික කොටු කිරීමේ ස්වභාවයක රැඳි පැවතුනි. කෙසේ වෙතත්, තනතුර භාරගන්නා විට ද බරපතල ලෙස රෝගාතුරව සිටි ඇන්ඩ්‍රොපොව් ඉන් මාස 15 කට පසුව, 1984 පෙබරවාරියේ දී වකුගඩු ආබාධයකින් මිය ගියේය. ඒ වෙනුවට පත්වූ කොන්ස්ටන්ටින් චර්නෙන්කෝ ද තවත් උග්‍ර සෝවියට් නිලධරයෙක් විය. ඔහු රැඳී සිටියේ 13 මසක් පමනි. චර්නෙන්කෝගේ අනුප්‍රාප්තිකයා වූ මිකායෙල් ගොර්බචෙව්ගේ අර්බුද ග්‍රස්ථ තන්ත්‍රය සෝසසසං දියකර හැරීමෙන් නිමාවිය. □

213. ග්ලාස්නොස්ට් යන දේශීය නිදහසේ හා පෙරෙස්ත්‍රොයිකා යන ආර්ථික ප්‍රතිසංස්කරනයේ, සීමිත පුලුල් කිරීමක් සහිත ද්විත්ව ප්‍රතිපත්තියකට ඔහු මුල පිරීය. ගොර්බචෙව් විසින් නායකත්වය දුන් නිලධරයේ එම කොටසෙහි මූලික අරමුන වූයේ, සෝවියට් ජනගහනය අතර පැවති විරෝධය ධනවාදය පුනස්ථාපනය කිරීමේ ප්‍රතිපත්ති පිටුපස පෙලගස්වා ගැනීමයි. දශක ගනනාවක ස්ටැලින්වාදී පාලනය මඟින් කම්කරුවන් තුල ඇතිකල අවමංගතවීම මත ගොර්බචෙව් විශ්වාසය රැඳවීය. එසේ ම ඔහු සුලු ධනපති වාම රැඩිකලුන්ගේ දේශපාලන සහයෝගය මත ද ඔට්ටු ඇල්ලීය. අගය කලහැකි නිපුනත්වයක් ප්‍රර්ශනය කල ගොර්බචෙව්ගේ එකම දේශපාලන ගනන් බැලීම මෙය විය. ධනපති මාධ්‍ය "ගෝර්බි උන්මාදය" ලෙස නම් පටබැඳි සංසිද්ධියේ දී තරම් වෙන කොතැනකදී වත්, වාම සුලු ධනේශ්වරය තුලින් එවන් සංයමයකින් තොර ප්‍රතිචාරයක් දිනාගත්තේ නැත. නිලධාරිමය ස්වයං ප්‍රතිසංස්කරනය පිලිබඳ පැබ්ලෝවාදී ඉදිරිදර්ශනයේ ප්‍රතිමූර්තියක් ගොර්බචෙව් තුල දැකගත් අර්නස්ට් මැන්ඩල් ඔහු, ඩිලානෝ රූස්වෙල්ට්ගේ සෝවියට් සංස්කරනයක් බඳු "අගය කල යුතු දේශපාලන නායකයෙක්" බව ප්‍රකාශ කලේය.[124] රෝස පැහැ ගැන්වූ උපැස් යුවලකින් අනාගතය දෙස එබී බැලූ මැන්ඩල්, සෝවියට් වර්ධනය පිලිබඳ රැවටිලිකාරී දසුන් හතරක් ගෙනහැර දැක්වීය. අවසන් බිඳවැටීමට යන්තම් වසර දෙකකට පෙර ඒ පිලිබඳව ලියන කතුවරයෙක් තුල නොදැකිය හැකි තරමේ අසාමාන්‍ය අන්ධභාවයක් ඔහු ප්‍රදර්ශනය කලේ, සෝසසසං දියකර හැරීමේ හැකියාව මේ එකදු කරුනකට හෝ ඇතුලත් නොවීමෙන්ය. මැන්ඩල්ගේ අනුගාමිකයා වූ බ්‍රිතාන්‍ය පැබ්ලෝවාදී සංවිධානයේ නායක තරික් අලිට, පෙරෙස්ත්‍රොයිකාව හා එහි නිර්මාතෘන් ගැන සිය උද්වේගය සඟවා ගත නොහැකි විය. 1988 පලකරන ලද ඉහල සිට විප්ලවය-සෝවියට් සංගමය යන්නේ කොයිබට ද? යන ඔහුගේ පොත කැපකලේ බෝරිස් යෙල්ට්සින්ට ය. යෙල්ට්සින් වෙත පුදකරන ඔහුගේ පාවී යන ප්‍රනාමය මෙසේ ප්‍රකාශ කලේය. "දේශපාලන ධෛර්යය ඔහු රටපුරා වැදගත් සංකේතයක් බවට පත් කර තිබේ."[125] සෝවියට් සංගමය වෙත කල සංචාරයන් විස්තර කරමින් ඔහු සිය පාඨකයන්ට දැනුම් දුන්නේ "මට දැනුනේ හරියට ම ගෙදර ඉන්නවා වගේය."[126] රුසියානු සමාජය විප්ලවකාරී ලෙස පරිවර්තනය කිරීමේ දී ගොර්බචෙව්ගේ ප්‍රතිපත්ති ආරම්භකත්වය ගත්තේ ඉහල සිටය. එසේ අවධාරනය කරන අතර අලි, නරුම ලෙස මෙසේ ද කියයි. "සෝවියට් සමාජය පරිවර්තනය කිරීම සෝවියට් කම්කරු පන්තියේ යෝධ ව්‍යාපාරයක් විසින් සිදුකලේ නම් හා අලුත් රුධිරයෙන් දේශපාලන බලයේ පැරනි අවයව, එනම් සෝවියට් සභා පනගැන්වූයේ නම්, මා ද ඇතුලු තවත් අය එය අගය කල හැකිව තිබුනි. එසේ වූයේ නම් ඉතා අනර්ඝය, නමුත් එය එසේ සිදුවූයේ නැත."[127] ඉන්පසු අලි, දේශපාලන ධාරනාවාදය, බොලඳකම හා පුද්ගල තකතිරුකම සමව ගෙන පැබ්ලෝවාදී ඉදිරිදර්ශනයට සම්බන්ධ සාරාංශයක් ඉදිරිපත් කරයි.

සෝවියට් ප්‍රභූවේ ප්‍රගතිශීලී හා ප්‍රතිසංස්කරනවාදී ප්‍රවාහයක් නියෝජනය කරන ගොර්බචෙව්ගේ ක්‍රියා මාර්ගය සාර්ථක වන්නේ නම්, සමාජවාදීන්ගේ හා ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ලෝක පරිමාන ජයග්‍රහනයක් ඉන් සලකුනු කෙරෙයි. සැබවින්ම ගොර්බචෙව්ගේ ක්‍රියාන්විතයෙහි පරිමාව, 19 වන සියවසේ ඇමරිකානු ජනාධිපති ඒබ්‍රහම් ලින්කන්ගේ ව්‍යායාමයට සමාන වෙයි. [128]

214. කම්කරු විප්ලවවාදී පක්ෂයේ හිටපු ට්‍රොට්ස්කිවාදීන් ගොර්බචෙව් තන්ත්‍රය හුවා දැක්වීමේ දී අවිවේචනාත්මක භාවයෙන් ඊට වඩා අඩු නොවී ය. ගොර්බචෙව් සෝවියට් සංගමයේ දේශපාලන විප්ලවයට නායකත්වය දෙන බව හීලි කියා සිටියේය. බන්ඩාට අනුව ගොර්බචෙව්ගේ පදවි ප්‍රාප්තිය නියෝජනය කලේ, ට්‍රොට්ස්කිවාදය සඳහට ම අවලංගුවී යාමයි. "පුනස්ථාපනය නොපැවතියේ නම්, ට්‍රොට්ස්කිට එය නිර්මානය කිරීම පරම වශයෙන් ම අවශ්‍ය වනු ඇත! ස්ටැලින් සමයෙහි ද ඉන් අනතුරුව ද මුලු මහත් සෝවියට් ඉතිහාසය ම මෙම ලදරු වාමවාදී සමපේක්ෂනයට එරෙහිව සාක්ෂි දරන අතර, විරුද්ධ දිශාවට ඇඟිල්ල දිගු කොට පෙන්වයි." ඔහු පැවසී ය. [129]

215. මෙම සංකල්පවලට විරුද්ධව හජාජාක 1986 තරම් ඈතදීම, ගොර්බචෙව්ගේ ආර්ථික පිලිවෙත් වල මූලික ප්‍රතිගාමී ස්වභාවය පහැදිලි කලේය. 1988 එහි ඉදිරිදර්ශන ලියවිල්ල තුල එය මෙසේ ලිවීය.

> ගොර්බචෙව් තමාගේ ප්‍රතිගාමී පෙරස්ත්‍රොයිකාව ක්‍රියාවට නැඟීමට යත්න දැරීමේ දී නිසැකව ම ඔප්පු කර සිටින්නේ, ස්ටැලින්වාදය පාදක වූ සියලු ආර්ථික පදනම්වල, එනම් තනි රටේ සමාජවාදය ගොඩ නැගිය හැකි ය යන්නෙහි පරිපූර්න කඩා වැටීම යි. සෝවියට් ආර්ථිකයේ තථ්‍ය අර්බුදයේ මූලය ඇත්තේ ලෝක වෙලඳපොලේ සම්පත්වලින් එය බලෙන් හුදකලා කරනු ලැබීම තුල ය. මෙම අර්බුදය සමග පොර බැදිය හැකි ක්‍රම දෙකක් පමනක් පවතී. ගොර්බචෙව් යෝජනා කරන මාවත, රාජ්‍ය කර්මාන්ත බිඳ විසිර වීම ද, සැලසුම් කිරීමේ මූලධර්මය අත් හැරීම ද, සෝවියට් සංගමය ලෝක අධිරාජ්‍යවාදී සැලැස්මට යලි ගැට ගැසීමක් වන විදේශ වෙලඳමේ රාජ්‍ය ඒකාධිකාරය අත් හැරීම ද අලලා ගනී. මෙම ප්‍රතිගාමී විසඳුමට ඇති විකල්පය යුරෝපයේ, උතුරු ඇමරිකාවේ හා ආසියාවේ ධනපති බල කඳවුරු තුලට සැලසුම් ගත ආර්ථිකය ව්‍යාප්ත කිරීම අරමුනු කර ගත් විප්ලවවාදී ප්‍රහාරයකට, සෝවියට් හා ජාත්‍යන්තර කම්කරු පන්තිය සන්ධාන ගත කිරීමකින් ලෝක ආර්ථිකය මත බල පවත්වන අධිරාජ්‍යවාදයේ ආධිපත්‍යය කුඩු කර දැමීමයි.[130]

216. ග්ලාස්නොස්ට් ප්‍රතිසංස්කරන හා මාධ්‍ය මත පනවා තිබූ වාරනය ඉවත්කිරීම, සෝවියට් සංගමය තුල දේශපාලන හා ඓතිහාසික ප්‍රශ්න මත සාකච්ඡාවන් සඳහා පිවිසුම් දොරටු විවර කිරීමක් විය. සිනොවියෙව්, කමනෙව්, බුකාරින් ඇතුලු බොහොමයක් පැරනි බොල්ශෙවිකයන්, නිලධරය විසින් ආපස්සට බලපාන පරිදි "පුනස්ථාපනය" කල අතර, මොස්කව් නඩු විභාග මුසාවන් මත පදනම්ව තිබූ බව පිලිගැනීමට ද ඔවුන්ට බලකෙරුනි. කෙසේ වුව ද නිලධරයට කිසි දිනෙක ට්‍රොට්ස්කි පුනස්ථාපනය කිරීමට නුපුලුවන් විය. ඒ ඔහුගේ විවේචන එල්ල කොට තිබුනේ සමස්ත නිලධරයේ ම සමාජ අවශ්‍යතාවන්වලට එරෙහිව වීම නිසා ය. මෙම අදහස් සෝවියට් කම්කරු පන්තියේ පුලුල් ශ්‍රාවකත්වයක් තුලට ගියේ නම් එය ධනපති පුනරුත්ථාපනයේ සැලසුම්වලට බරපතල තර්ජනයක් විය හැකිව තිබුනි. 1987 දී ගොර්බචෙව්, ට්‍රොට්ස්කිගේ අදහස් "මුලසිට ම ලෙනින්වාදයට අවශ්‍යයෙන් ම එල්ල කල ප්‍රහාරයක් වූ බව" අවධාරනය කලේ ය.

217. 1989 -1991 අතර කාලයේ සෝවියට් සංගමයට සංචාර ගනනාවක් සංවිධානය කරමින් ද, රුසියානු බසින් න්‍යායික සඟරාවක් පල කරමින් ද, හජාජාක සෝවියට් ජනතාව අතරට ට්‍රොට්ස්කිවාදී ඉදිරිදර්ශනය ගෙනයාමට උත්සාහ දැරීය. එහි වැඩ කටයුතු යොමුවූයේ, ඔක්තෝබර් විප්ලවය තුල ට්‍රොට්ස්කිට හිමි තැන ද, ස්ටැලින්වාදයට එරෙහි ට්‍රොට්ස්කිගේ අරගලයෙහි මූලාරම්භය හා වැදගත්කම ද, හතරවන ජාත්‍යන්තරයේ දේශපාලන ක්‍රියාමාර්ගය හා සෝවියට් සංගමය මුහුන දෙන අර්බුදයේ ස්වභාවය ද පැහැදිලි කිරීමට ය. හජාජාක, සෝවියට් සංගමය දියකර හැරීමත්, ධනවාදය පුනස්ථාපනය කිරීමත් මඟින්, සෝවියට් කම්කරුවන් මත ඇති කල හැකි විනාශකාරී ප්‍රතිවිපාකයන් පිලිබඳව නැවත නැවතත් අනතුරු ඇඟවීය. 1991 ඔක්තෝබරයේ දී කියෙෆ්හි දී කථාකල ඩේවිඩ් නෝර්ත් මෙසේ පැහැදිලි කලේයඃ

> මෙරට තුල ධනවාදය පුනස්ථාපනය කල හැක්කේ, තවමත් පවත්නා නිෂ්පාදන බලවේගයන් හා ඒවා මත පදනම්ව ඇති සමාජ-සංස්කෘතික ආයතනවල පුලුල් විනාශයක් මතින් පමනකි. වෙනත් වචනවලින් කිව හොත්, ධනේශ්වර පදනමක් මත සෝසසසං ලෝක අධිරාජ්‍යවාදී ව්‍යුහය තුලට ඒකාබද්ධ කිරීමේ අර්ථය, පසුගාමී රටක් තුල හෙමින් හෙමින් ඇතිකරන සංවර්ධනයක් නොව, තුන්වන ලෝකයට වඩා දියුනු රටවල පවත්නා තත්වයට. අඩුතරමින් කම්කරු පන්තිය

සඳහාවත්, වඩාත් සමීප තිරසාර ජීවන තත්වයන් සැලසී ඇති ආර්ථිකයක විනාශයයි. ධනේශ්වර පුනස්ථාපනයේ නියමුවන් විසින් කථිකා කරන විවිධ යෝජනාක්‍රම පිරික්සා බලනවිට එය, ලෝක ධනේශ්වර ආර්ථිකයේ සැබෑ යාන්ත්‍රනය පිලිබඳව ස්ටැලින් පෙන්නුම් කල මුග්ධත්වයට නොඅඩු දෙයක් බව යමෙකුට නිගමනය කල හැකිය. ස්ටැලින්ගේ තත්කාර්යවාදී හා ජාතිකවාදී ප්‍රතිපත්ති මඟින් නිර්මානය කලාක් වැනි අන්ධකාරයෙන් වැසීගිය සාමාජ බේදාන්තයක් සඳහා පසුබිම ඔවුහු සකස් කරමින් සිටිති. මෙය න්‍යායික ප්‍රස්ථාරයකට වඩා, නැගෙනහිර යුරෝපයේ වැඩි හරියක දැනට පවත්නා යථාර්ය (ධනේශ්වර පුනස්ථාපනයේ සමාජ ව්‍යසනය), සෝසසසං ද අනාගතයට එල්ල කරන තර්ජනයක් බවට පත්වීම පිලිබඳ ප්‍රශ්නයකි. ධනවාදය පුනස්ථාපනය කර තිබෙන හෝ එසේ කෙරෙමින් තිබෙන සෑම රටක ම පාහේ ප්‍රතිපලය වී ඇත්තේ ජාතික ආර්ථිකයේ ව්‍යසනකාරී බිඳ වැටීමකි. [131]□

1991 දෙසැම්බරයේ දී සෝවියට් සංගමය දියකර හැරීමෙන් පසු කාලින සිදුවීම් වල තත්‍ය ගමන් මග විසින්, මෙම අනතුරු ඇඟවීම් මුලුමනින්ම සනාථ කර තිබේ.□

## සෝසසසං අවසානය

218. 1991 දෙසැම්බර් 25 වන දින සෝවියට් සංගමය නිල වශයෙන් දියකර හැරීම, ඔක්තෝබර් විප්ලවයෙන් වසර 74 කට පසුව, තීරනාත්මක න්‍යායික, ඓතිහාසික හා දේශපාලන ප්‍රශ්න ජාත්‍යන්තර කමිටුව හමුවට පැමිනවීය. ඔක්තෝබර් විප්ලවයේ පදනම මත නැඟී ආ රාජ්‍යයේ සම්භවය, සමාජ ස්වභාවය හා දේශපාලන ඉරනම, හතරවන ජාත්‍යන්තරය පිහිටවූ තැන් පටන් ප්‍රධාන කොට ම එය වසාගෙන පැවතුනි. 1930 ගනන් තරම් ඈතට විහිද ගිය ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ, කටුක කාන්ඩ ගැසීම් සමඟ නිරන්තරව බැඳී තිබුනු නොගිනිය හැකි තරම් අරගලයන්හි දී, " රුසියානු ප්‍රශ්නය" තීව්‍ර ගැටුම්වල මාතෘකාව බවට පත්ව තිබුනි. හතරවන ජාත්‍යන්තරය තුල 1940 හා 1953 භේදයන්ගේ හරි මැද තිබුනේ සෝවියට් සංගමයේ ස්වභාවය පිලිබඳ ප්‍රශ්නයයි. දෙවන ලෝක යුද්ධයෙන් පසුව නැගෙනහිර යුරෝපය තුල පිහිටුවන ලද රාජ්‍යයන්ගේ පන්ති පදනම පිලිබඳ ප්‍රශ්නය තීරනාත්මක ඓතිහාසික හා සමකාලීන ප්‍රශ්නය ලෙස 1985-86 භේදයෙන් පසුව ජාත්‍යන්තර කමිටුව හමුවේ වහාම යලි හිස එසවීය. සියලු සංශෝධනවාදී ප්‍රවනතා එක් හෝ තවත් ආකාරයකට, මධ්‍යම හා කල් පවත්නා ඓතිහාසික ක්‍රියා කලාපයක්, ස්ටැලින්වාදය වෙත පවරා දුන්හ. 1953 දී පැබ්ලෝ හා මැන්ඩල්, සියවස් ගනනාවක් පවත්නා විකෘති කම්කරු රාජ්‍යයන් පිහිටුවීමට තුඩුදෙන, ස්ටැලින්වාදීන් විසින් නායකත්වය ගන්නා විප්ලවයන් හරහා, සමාජවාදය සාක්ෂාත් කෙරෙනු ඇතැයි අනාවැකි පල කලහ. 1983 කව්පය තුල දේශපාලන අර්බුදය හටගැනීමට මඳකට පෙර මයිකල් බන්ඩා නෝර්ත්ට පැවසුවේ, සෝවියට් සංගමය ගැට ගසා ගැනීම "නිමාව දුටු ප්‍රශ්නයක්" බවත්, ට්‍රොට්ස්කි අනතුරු ඇඟවූ පරිදි එහි පැවැත්ම අවසාන විය නොහැකි බවත් ය. බන්ඩාගේ ප්‍රකාශයෙන් දශකයකටත් අඩු කාලයක දී නැගෙනහිර යුරෝපයේ හා සෝසසසං ස්ටැලින්වාදී තන්ත්‍රයන් ඉතිහාසයට එක්විය. □

219. සෝවියට් සංගමය දියකර හැරීමෙන් පසුව ගතවූ මාස තුල, සංශෝධනවාදී සංවිධාන කිසිවකට හෝ එම සිද්ධියේ වැදගත්කම පිලිබඳව විශ්වාසනීය තක්සේරුවක් කල නොහැකි විය. බොහෝ පැබ්ලෝවාදී ප්‍රවනතාවන් එවැන්නක් කවර කලෙකවත් සිදු නොවූ ආකාරයකට එය නොතකා හලහ. නිලධරයේ සර්ව බලධාරිත්වය ගැන එතරම් ම උද්‍යෝගයකින් විශ්වාසය තැබූ ඔවුන්ට, සෝසසසං තවදුරටත් නොපවතින බව පිලිගැනීම බෙහෙවින් දුෂ්කර විය. තවද, සෝසසසං විසුරුවා හැර ඇති බව පිලිගත් අය පවා, තවමත් තර්ක කරන්නේ, රාජ්‍යයේ පන්ති ස්වභාවය මේ මඟින් අවශ්‍යයෙන්ම වෙනස් කර නැති බවයි. සෝවියට් සංගමය නොමැතිව පවා රුසියාවට, "කම්කරු රාජ්‍යයක්" ලෙස පැවතිය හැකිලු, මෙය, විසුරුවා හැරීමෙන් වසර ගනනාවක් යනතෙක්, රොබර්ට්සන්ගේ ස්පාටසිස්ට් කන්ඩායමේත්, කම්කරු විප්ලවවාදී පක්ෂයේ කැබැල්ලකගේත්, ආස්ථානයව පැවතුනි. □

220. පැබ්ලෝවාදී ප්‍රවනතාවන් විසින් අංගලක්ෂනය කල ස්ටැලින්වාදය පිලිබඳ විවිධ වර්ගයේ මිත්‍යාවන් න්‍යායිකව හා දේශපාලනිකව විරේක කිරීමටත්, සෝවියට් සංගමය විසුරුවා හැරීම පිලිබඳව, වෛෂයික හා නිවැරදි තක්සේරුවක් කාලීන ආකාරයකට සිදු කිරීමටත්, ජාත්‍යන්තර කමිටුවට හැකිවිය. 1992 ජනවාරි 4 වන දින පහත දැක්වෙන තක්සේරුව ඉදිරිපත් කරන ලදී.

> 1985 මාර්තුවේ ගොර්බචෙව් බලයට පත් තැන් පටන්, නිලධරය අනුගමනය කල ප්‍රතිපත්තිවල කූලුගැන්වීම සලකුනු කලේ, පෙර මාසයේ සිදුවීම්වලින් පසුව ය. සෝවියට් සංගමය නිල වශයෙන් විසුරුවා හැරීමේ නිශ්චිත පාඩම් උකහා ගැනීම අනිවාර්ය ය. ස්වාධීන රාජ්‍යයන්ගේ සංගමය සමස්තයක් ලෙස හෝ එය සෑදුම්ලත් එක් එක් සමූහාන්ඩුවක් හෝ කම්කරු රාජ්‍යයක් ලෙස අර්ථ දැක්වීම කල නොහැකිය. එසේ කිරීම වනාහි, පූර්ව කාල පරිච්ඡේදයෙහි එය

ප්‍රකාශයට පත්කල සංයුක්ත අන්තර්ගතයෙන් අර්ථ නිරූපනය මුලුමනින්ම වෙන් කිරීමකි.

සෝවියට් සංගමය පරිහානිගතවීම පිලිබඳ ප්‍රමාණාත්මක සන්තතිය, ගුනාත්මක පරිවර්තනයකට මුල පිරීය. සෝවියට් සංගමය අවසන් කිරීම හෝ ස්වාධීන රාජ්‍යයන්ගේ සංගමයක් (සීඅයිඑස්) පිහිටුවීම. හුදෙක් හෝඩියේ අකුරු එහා මෙහා කිරීමක් නො වේ. එහි නිශ්චිත දේශපාලන හා සමාජ ඇඟවීම් ගැබ් විය. කම්කරු රාජ්‍යයේ නිල විසුරුවා හැරීම හා ජාතික ආර්ථිකයේ ද, ඔක්තෝබර් විප්ලවයෙන් උරුම වූ සැලසුම්කරනයේ ද, ඉතිරි පහදු විනාශ කිරීමට එකහෙලා හා විවෘතව කැපවූ තන්ත්‍රයන් මඟින් එහි ඌනපූරනය ද, එය නියෝජනය කලේ ය. [132] □

221. සෝසසසං නිලධාරි පැලැන්තිය විසින් ඉටු කල ක්‍රියා කලාපය, දුර දිග යන දේශපාලන ඇඟවුම් ගැබ්කර ගනියි.

පැරනි සෝවියට් සංගමය තුල සිදු වූයේ කුමක්ද යන්න ජාත්‍යන්තර සංසිද්ධියක ප්‍රකාශනයකි. පූර්ව කාල පරිච්ඡේදය තුල තමන් විසින් ගොඩනැගූ වෘත්තිය සමිති, පක්ෂ හා රාජ්‍යයන් පවා අධිරාජ්‍යවාදයේ ඍජු උපකරන බවට පරිවර්තනය වීමේ කාරනයට, ලෝකය පුරා ම කම්කරු පන්තිය මුහුන පෑවේය. □

කම්කරු නිලධරය, පන්ති අරගලය " බේරුම්කල" හා පන්තීන් අතර බෆරයක් ලෙස ක්‍රියාකල කාලය, අවසන්ව ඇත. නිලධරය කම්කරු පන්තියේ ඓතිහාසික අවශ්‍යතාවන් පොදුවේ පාවා දෙනු ලැබුව ද, සීමිත අර්ථයකින් ඔවුන් තවමත් දෛනික ප්‍රායෝගික අවශ්‍යතා සඳහා සේවය කල තාක් දුරට කම්කරු පන්ති සංවිධානවල නායකයන් ලෙස සිය පැවැත්ම " යුක්තිසහගත" කලහ. ඒ යුගය අවසන්ව ඇත. වත්මන් අවධියේ දී නිලධරයට එවන් ස්වාධීන ක්‍රියාකලාපයක් ඉටුකල නොහැක. මෙය සත්‍ය වන්නේ සෝසසසං ස්ටැලින්වාදී නිලධරය සම්බන්ධයෙන් පමනක් නො වේ. ඇමරිකානු වෘත්තීය සමිති නිලධරය සම්බන්ධයෙන් ද සත්‍යයකි. අපගේ අවසන් සමුලුවේ දී, වර්තමාන වෘත්තිය සමිති නායකයන්, සීමිත හා විකෘති ආකාරයකට වත් කම්කරු පන්තියේ අවශ්‍යතා ආරක්ෂා හෝ නියෝජනය කරන බලවේගයක් ලෙස නිර්වනය කල නොහැකි බව අපි අවධාරනය කලෙමු. ඒඑෆ්එල්-සීඅයිඕ නායකයන් "වෘත්තීය සමිති නායකයන්" ලෙස හෝ ඒ අර්ථයෙන් ඒඑෆ්එල් - සීඅයිඕ, කම්කරු පන්ති සංවිධානයක් ලෙස අර්ථ නිරූපනය කිරීම කම්කරු පන්තිය මුහුන දෙන යථාර්ථයට ඔවුන් අන්ධ කිරීමකි. [133]

## ඓතිහාසික මුසාකරනයේ පශ්චාත් සෝවියට් ගුරුකුලයට එරෙහි අරගලය

222. සෝවියට් සංගමය විසුරුවා හැරීම, ධනේශ්වරය හා එහි දෘෂ්ටිවාදාත්මක ක්ෂමාලාපකයන් තුල ඉහ වහා ගිය ජයග්‍රාහිත්වයේ උමතුවක් ජනනය කලේ ය. සමාජවාදී අනිටු පලවිපාක සඳහට ම බිමට ඇද දැමිනි. සෝවියට් සංගමයේ අවසානය පිලිබඳ ධනේශ්වර අර්ථ කථනය එහි අත්‍යවශ්‍ය ප්‍රකාශනය සොයා ගත්තේ ෆ්‍රැන්සිස් ෆුකුයාමාගේ ඉතිහාසයේ අවසානය කෘතිය තුලය. නිර්බාධක ධනේශ්වර වෙලඳපොල මත පදනම් වූ එක්සත් ජනපද ලිබරල් ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ මෝස්තරයක් වූ, එහෙත් මෙහෙන් ඇහිඳ ගත් හේගල්ගේ සාංසිද්ධික භාවයේ ප්‍රස්තුතය යොදාගනිමින් ෆුකුයාමා කියා සිටියේ, ඉතිහාසයේ වෙහෙසකර ගමන එහි අවසාන නවාතැන්පල කරා ලඟා වූ බවයි. මෙය මානව ශිෂ්ඨාචාරයේ ඉහල ම තුඩයි. මෙම තේමාව නිමක් නැති වෙට්ටු දැමීම් සහිතව, ඉතිහාසයේ දිනන පැත්තට ඔට්ටු අල්ලන, ඕනෑම දී ඇති මෙහොතක තමන්ට ලැබෙනු ඇත්තේ කුමක්දැයි සාංකාවෙන් පසුවන. ලෙහෙසියෙන් රැවටෙන හා ධාරනාවාදී සුලු ධනපති ශාස්ත්‍රාලිකයන් විසින්, විස්තාරනය කර තිබේ. සෝවියට් සංගමයේ බිඳ වැටීමෙන් එලඹ ගත යුතු නිගමනය වූයේ, සමාජවාදය මිත්‍යාවක් වූ බවයි. ඉතිහාසඥ මාටින් මාලියා ලිව්වේ "සංක්ෂිප්තව, සමාජවාදය වනාහි එම යෙදුමේ සාහිත්‍යමය අර්ථයෙන් මනෝ රාජ්‍යයකි, තැනක් නැති හෝ කොහේවත් නැති, දැක ගත යුත්තේ අදහසක් ලෙස ය." [134] අවසාන බිඳවැටීමේ මොහොත දක්වා ම වාගේ සමාජවාදයේ ඇපකාරයා ලෙස ස්ටැලින්වාදී නිලධරය වෙත දෑස් යොමා සිටි වාමාංශිකයන් හමුවේ, ධනපති ජයග්‍රාහකත්වය බෙහෝකොට ම අනභියෝගීව පෙරට ගියේ ය. සැබවින්ම ඔවුන්, සෝවියට් සංගමයේ අවසානය සලකුනු කලේ සමාජවාදයේ අසාර්ථකත්වය බවට, ෆුකුයාමා හා මාලියාට වඩා අඩුවෙන් ඒත්තු ගත්තා නො වේ. බොහෝ අවස්ථාවන්හි ඉච්ඡා භංගත්වයට පත්වූවෝ, සිය අතීත උපකල්පන හා ඉදිරිදර්ශන සමාලෝචනය කිරීමට ඇති අකමැත්ත නිසා, සමාජවාදය නීතියුක්ත ඓතිහාසික ව්‍යාපෘතියක් ලෙස පිලිගැනීමෙන් වැලකී එය හෙලා දකිති. මාක්ස්වාදවට ශාපකර එය අතහැර දැමීමට උත්සුකවන හා සෝවියට් සංගමය බිඳ වැටීම පිටුපස ඇති ප්‍රශ්න සියල්ලෙන් ස්ටැලින්වාදය පිලිබඳ ට්‍රොට්ස්කිගේ විවේචන, අවම ලෙසින් හෝ පොරබැදීමට අකැමැත්ත දක්වන්නවුන් ඇත්තේ සුලුපටු සංඛ්‍යාවක් නො වේ. ඔවුන් මගහැරීමට උත්සාහ දරන්නේ ස්ටැලින්වාදයට විකල්පයක් තිබුනේ ද යන ප්‍රශ්නය යි. එනම්, 1920 ගනන්වල තීරනාත්මක වූ පක්ෂ අභ්‍යන්තර අරගල තුල ට්‍රොට්ස්කිගේ දේශපාලන ක්‍රියාමාර්ගය පෙරට ගියේ

නම් සෝවියට් සංගමයේ හා විසිවන සියවසේ ම ඉතිහාසය වෙනත් මං ඔස්සේ වර්ධනය වීමට ඉඩ නොතිබුනේ ද යන්නයි.

223. කොමියුනිස්ට් පක්ෂයේ දිගුකාලීන සාමාජිකයෙක් වන ඉංග්‍රීසි ජාතික ඉතිහාසඥ එරික් හොබ්ස්බෝම්, සැබවින්ම සිදුවූ දෙයට වඩා, වෙනස් වූ වර්ධනයක හැකියාව පිලිබඳව අවධානය යොමු කිරීම, ඉතිහාසඥයෙකුට අනුචිත වන බව විශේෂයෙන් ප්‍රකාශ කලේ ය. "රුසියානු විප්ලවයට සමාජවාදය ගොඩනැඟීමට ඉරනම්ව තිබුනේ, පසුගාමී හා වහා ම සුන්බුන් බවට පත්ව තිබූ රටක් තුලය" [135] විප්ලවවාදී ව්‍යාපෘතිය ම පදනම් වූයේ දේශපාලන ශක්‍යතාවන් පිලිබඳව කල, තරයේ ම අභව්‍ය තක්සේරුවක් මතය. රුසියානු විප්ලවය පිලිබඳ විකල්ප ප්‍රතිපලයක් සලකා බැලීම පවා තේරුමක් නැතැයි හොබ්ස්බෝම් තර්ක කලේය. "ඉතිහාසය ආරම්භ විය යුත්තේ සිදුවූයේ කුමක්ද යන්නෙනි. අන් සියල්ල සමපේක්ෂනයයි" [136] හොබ්ස්බෝම් ප්‍රකාශ කලේය.

224. ස්ටැලින්වාදයේ ඓතිහාසික විකල්පයන් පිලිබඳ කුමන තක්සේරුවක් හෝ අවඥාවෙන් බැහැර කල හොබ්ස්බෝම්ට පිලිතුරු දෙමින් නොර්ත් මෙසේ ලිවිය.

> මෙය තරමක් සැහැල්ලු සංකල්පයකි. "සිදුවූයේ කුමක්ද" යන්න සම්බන්ධයෙන් නම්, දිනය තුල පුවත්පත්වල වාර්තා වූයේ කුමක්ද යන්නට වැඩි කිසිවක් නැති ලෙස ගැනීම, නිශ්චිතව ම ඓතිහාසික ක්‍රියාවලියේ සුලු කොටසක් පමනි. සියල්ලට පසුව, ඉතිහාසයම උත්සුකවිය යුත්තේ හුදෙක් "සිදුවූයේ කුමක්ද" යන්න ගැන පමනක් නොව, වඩාත් වැදගත් වන එක් හෝ තවත් දෙයක් සිදුවූයේ මන්ද හෝ සිදු නොවූයේ මන්ද, හා සිදුවිය හැකිව තිබුනේ කුමක්ද යන්න ගැනය. සිදුවීමක් ගැන යමෙක් සැලකිලිමත් වන විටම, එනම් " සිදුවූයේ කුමක්ද" යන්න, ක්‍රියාවලිය හෝ අන්තර්ගතය සලකාබැලීමට යමෙක් තෙමේට ම බල කෙරෙන බව දැනගනියි. 1924 දී සෝවියට් සංගමය "තනි රටක සමාජවාදය" පිලිබඳ ප්‍රතිපත්තියට අනුගත වූ බව සැබෑය. එය "සිදුවිය" එසේම "තනි රටක සමාජවාදයට" විරුද්ධත්වය ද "සිදුවිය" හොබ්ස්බෝම් වචනයක් වත් සඳහන් නොකරන, ස්ටැලින්වාදී නිලධරය හා වාම විපාර්ශවය අතර ගැටුම, " සිදුවිය." ඔහු හැකිතාක් දුරට හිතාමතාම නොවැදගත් යයි බැහැර කරන හෝ ප්‍රතික්ෂේප කරන, සෝවියට් සංගමය වෙනත් දිශාවකට යොමු කරන ප්‍රතිපත්ති කෙරෙහි උත්සුක වූ විපාර්ශවීය බලවේග පිලිබඳව "සිදුවූයේ කුමක්ද" යන ඔහුගේ නිර්වචනයෙහි අඩංගු වන්නේ ඉතා සංකීර්න ඓතිහාසික යථාර්තයක් පිලිබඳ, ඒක පාර්ශවික, ඒක මානීය, තත්කාර්යවාදී හා ග්‍රාම්‍ය සරලෝක්තියකි. හොබ්ස්බෝම් ගැන කිවහොත්, "සිදුවූයේ කුමක්ද" යන්නෙන් පටන්ගැනීමේ සරල අදහස වන්නේ "දිනුවේ කවුද" යන්නෙන් පටන් ගෙන අවසාන වීමයි. [137]

225. හොබ්ස්බෝම්ගේ ඉරනම්වාදී ක්ෂමාලාපයන් වනාහි, සෝවියට් සංගමය බිඳවැටීමෙන් පසුව ඓතිහාසික මුසාකරනයේ දැවැන්ත ව්‍යාපාරය පිලිබඳ පිරිපහදු කල හා පන්ඩිතමානී ප්‍රකාශනයකි. මෙම ව්‍යාපාරයේ ප්‍රධාන ක්‍රියා කලාපයක් ඉටු කල පැරනි සෝවියට් සංගමයේ හිටපු ස්ටැලින්වාදීන්, එක රැයකින්ම පාහේ එපාම කරපු ප්‍රතිකොමියුනිස්ට්වාදීන් බවට තෙමේ ම පරිවර්තනය වූවන්ය. තොරතෝංචියක් නැතිව ඔවුන් කියාසිටියේ රුසියානු විප්ලවය, රුසියානු ජනතාවට එරෙහි සාපරාධී කුමන්ත්‍රනයක් බවය. මෙම වර්ගයේ බෙහෙවින් ප්‍රකට පුද්ගලයා ජෙනරාල් ඩිමිත්‍රි වොල්කොගනොව්ය. ලෙනින් පිලිබඳ ඔහුගේ චරිතාපදානය තුල වොල්කොගනොව්, සමහරවිට ඔහු අදහස් කලාට වැඩියෙන් එකතු කරමින්, ලෙනින් කෙරෙහි ඔහුගේ ම ආකල්පයේ වෙනස්කම් පෝෂනය කලේ, "සියල්ලටත් වඩා ප්‍රධාන ඓතිහාසික පරාජයකට මුහුන දුන් හා මිලියන ගනනකගේ ජීවිතවලින් වන්දි ගෙවීමට සිදුවූ මාවතක් ඔහු තෝරා ගත් නිසා බව පිලිගන්නේ ය"යි ප්‍රකාශ කලේය. [138] වොල්කොගනොව් ලෙනින්ට චෝදනා කල "අපරාධ" අතර එකක් වූයේ, කිසිවෙකුට හානි සිදු නොකල සිදුවීමක් වන, 1918 ජනවාරියේ ව්‍යවස්ථාදායක සභාව විසුරුවා හැරීමයි. එහෙත් මෙය, ජනාධිපති බොරිස් යෙල්ට්සින්ගේ හමුදා උපදේශක ලෙස වොල්කොගනොව් ඔහුගේ මට්ටමින්, 1993 ඔක්තෝබරයේ දී මිනිසුන් 2000 ක් තරම් ඉහල සංඛ්‍යාවකට මරු කැඳවූ බවට ගනන් බලා ඇති, ප්‍රජාතන්ත්‍රවාදීව තෝරා පත් කර ගත් රුසියානු පාර්ලිමේන්තුව වන රුසියානු ධවල මන්දිරයට යුද ටැංකිවලින් කාලතුවක්කු ප්‍රහාර එල්ල කරනු අධීක්ෂනය කිරීමෙන්, ඔහු වලකාලූයේ නැත.

226. 1992 සිය සමුලුවේ දී ජාත්‍යන්තර කමිටුව, පෙරට ඇදෙන ධනවාදයේ අර්බුදය හා පන්ති අරගලය අතර සම්බන්ධතාවයේ වෛෂයික ක්‍රියාවලිය හා සමාජවාදී විඥානයේ වර්ධනය පිලිබඳව සාකච්ඡා කලේය.

> පන්ති අරගලයේ උත්සන්නවීම, විප්ලවාදී ව්‍යාපාරයේ මූලික අත්තිවාරම සම්පාදනය කරනු ඇත. එහෙත් එය. එහි වර්ධනයට අවශ්‍ය දේශපාලන, බුද්ධිමය හා යමෙකුට ඊට එකතුකල හැකි සංස්කෘතික

පසුබිම ද, සෘජු ලෙස ඒ තුලින්ම හා ස්වයංක්‍රීයව නිර්මානය නොකරයි. සැබෑ විප්ලවවාදී තත්වයක් සඳහා ඓතිහාසික සැකැස්ම සූදානම් කරන්නේ එම පසුබිම තුලය. විප්ලවවාදී ව්‍යාපාරය සඳහා අවශ්‍ය පොදු වෛෂයික පදනමත්, එය අධිකාරවත් ඓතිහාසික බලයක් බවට පත්කරන සංකීර්න දේශපාලන, සමාජ හා සංස්කෘතික ක්‍රියාවලියත් අතර මෙම විශේෂත්වය ග්‍රහනය කරගන්නාවිට පමනක් අපට, ස්ටැලිනවාදයට එරෙහි අපගේ ඓතිහාසික අරගලයේ වැදගත්කම අවබෝධ කරගත හැකිවන අතර, අද අප හමුවට පමුනුවා ඇති කර්තව්‍යන්ගේ වැදගත්කම ද දැකගත හැකිවනු ඇත. [139] □

227. ජාත්‍යන්තර කම්කරු පන්තිය තුල සමාජවාදී සංස්කෘතිය යලි පනගැන්වීමට, ඉතිහාසයේ මුසාකරනයන්ට එරෙහි ක්‍රමානුකූල අරගලයක් අවශ්‍ය කෙරෙයි. විසිවන සියවසේ අව්‍යාජ ඉතිහාසයෙන් කම්කරු පන්තිය උගන්වා ගැනීම ද, එහි අරගලයන් රුසියානු විප්ලවය ද ඇතුලත්, විප්ලවවාදී සමාජවාදයේ ශ්‍රේෂ්ඨ සම්ප්‍රදායන් සමග යලි බද්ධ කිරීම ද අවශ්‍ය වේ. 1992 මාර්තු සමුලුවෙන් පසුව, ඓතිහාසික මුසාකරනයේ පශ්චාත් සෝවියට් ගුරුකුලයෙහි අභ්‍යර්තනයන් නිෂ්ප්‍රභා කර, ඓතිහාසික සත්‍යය ආරක්ෂා කිරීමේ ව්‍යාපාරයක් ජාක විසින් දියත් කලේය. 1993 ආරම්භයේ දී, ප්‍රමුඛ සෝවියට් මාක්ස්වාදී සමාජ විද්‍යාඥයෙක් හා ඉතිහාසඥයෙක් වූ වාඩිම් රොගෝවින් සමඟ ජාක, සමීප සහයෝගීතාවකට මුලපිරීය. සෝවියට් ශස්ත්‍රාලිකයන්ගේ පුලුල් කොටස් තියුනු ලෙස දකුනට ගමන් කරමින් ධනපති පුනස්ථාපනයට සහයෝගය දෙන කොන්දේසි යටතේ, ට්‍රොට්ස්කි හා වාම විපාර්ශවය පුනස්ථාපනය කිරීමේ කටයුතුවලට රොගෝවින් මුලපිරී ය. 1993 දී විකල්පයක් තිබුනේද යන ශිර්ෂ පාඨය සහිතව වාම විපාර්ශවයේ මතුව ඒම සමාලෝචනය කරමින් පොතක් ලියා අවසන් කිරීමෙන් පසුව, ජාත්‍යන්තර කමිටුවේ නියෝජිතයන්ට ප්‍රථම වරට රොගෝවින් මුන ගැසුනි. ඒවන විටත් ඔහු හජාජාක රුසියානු බසින් පලකරන හතරවන ජාත්‍යන්තරය සඟරාව වසර කිපයක් තිස්සේ ම කියවා තිබුනි. ඓතිහාසික මුසාකරනයේ පශ්චාත් සෝවියට් ගුරුකුලයට එරෙහිව, ජාත්‍යන්තර ව්‍යාපාරයක් ගෙනයාම පිලිබඳ යෝජනාව, ඔහු උද්යෝගයෙන් පිලිගත්තේය. පිලිකාවක් නිසා බෙහෙවින් රෝගාතුරව සිටිය දී ද රොගෝවින්, ජාත්‍යන්තර කමිටුවේ ද සහයෝගය ඇතිව, 1998 සැප්තැම්බරයේ ඔහු අභාවයට පත්වීමට පෙර. විකල්පයක් තිබුනේ ද කෘතියේ තවත් වෙලුම් හයක් නිම කලේය. □

228. 1992 මාර්තුවේ පැවති සමුලුවේ දී, කම්කරු පන්තියේ සමාජවාදී විඥානය ගොඩනැගීමේ ගැටලු පොරබදමින් කල විශ්ලේෂනයේ පදනම මත, ජාත්‍යන්තර කමිටුව සිය වැඩ කටයුතු සංස්කෘතික ප්‍රශ්න කරා ද පුලුල් කලේය. මෙම දෘෂ්ටිය, එහි පරිපූර්න ප්‍රකාශනය අත්කර ගත්තේ, ලියෝන් ට්‍රොට්ස්කිගේ දිනපතා ජීවිතයේ ගැටලු හා සාහිත්‍ය හා විප්ලවය ද, ඇලෙක්සැන්ඩර් වොරන්ස්කිගේ ජීවිතය සංජානනය කිරීම ලෙස කලාව වැනි කෘතීන් තුලිනි. මෙම සම්ප්‍රදාය තුල වැඩ කරමින් එය ගොඩනැගීමේ දී, විප්ලවවාදී විඥානය වර්ධනය කිරීම බුද්ධිමය රික්තයක් තුල සිදු නොවන බවත්, එයට සංස්කෘතික පෝෂ්‍යපදාර්ථ අවශ්‍ය කෙරෙන බවත්, මාක්ස්වාදී ව්‍යාපාරයට, වැඩිදියුනු, බුද්ධිමය වශයෙන් විවේචනශීලී හා සාමාජීයව ග්‍රහනය කර ගත හැකි පරිසරයක් නිර්මානය කිරීමට දිරිගැන්වීමේ හා දායකත්වය සැපයීමේ දී වැදගත් ක්‍රියා කලාපයක් ඉටු කිරීමට ඇති බවත්, ජාත්‍යන්තර කමිටුව වටහා ගත්තේය. 1998 ජනවාරියේ දී පැවැත්වූ දේශනයක දී ඩේවඩ් වොල්ෂ් මෙසේ සඳහන් කලේ ය.

> සිය දේශපාලන ක්‍රියාමාර්ගය හා ඉදිරිදර්ශනය ග්‍රහනය කරගන්නා වූ ද, ඊට ප්‍රතිචාර දක්වන්නා වූ ද ශ්‍රාවකත්වයක් ගොඩනගා ගැනීමේ දී මාක්ස්වාදීහු සැලකිය යුතු අභියෝගයකට මුහුනපාති. වර්තමාන තත්වයන් යටතේ, පොදු විඥානය සුපෝෂනය කිරීම සඳහා වන අවශ්‍යතාවය නොතකා හැරීම බෙහෙවින්ම වගකීම් විරහිත ක්‍රියාවකි.
>
> විප්ලවය සිදුවන්නේ කෙසේ ද? එය හුදෙක් වාසිදායක වෛෂයික කොන්දේසි විෂය කර ගැනීම සඳහා කෙරෙන සමාජවාදී උද්ඝෝෂනයේ හා ප්‍රචාරනයේ නිමැවුමක් ද? මෑත වසරවල පක්ෂයක් ලෙස අප මේ ගැන සිතා බැලීමට බොහෝ කාලයක් මිඩංගු කර තිබේ. අප එලඹගත් නිගමනය වූයේ, 1917 විප්ලවය හුදෙක් ජාතික හෝ ජාත්‍යන්තරව පවා ඇතිවූ දේශපාලන හා සමාජ ක්‍රියාවලියක ප්‍රතිඵලය නොව, ජාත්‍යන්තර සමාජවාදී සංස්කෘතියක් ගොඩනැගීමටත්, සිය පක්ෂය තුලට ගෙන එනු ලැබූ එම සංස්කෘතිය තුලට, ධනේශ්වර දේශපාලන හා සමාජ චින්තනයේ එනම්, කලාව හා විද්‍යාවේ වඩාත්ම තීරනාත්මක ජයග්‍රහන උකහා ගැනීමට දශක ගනනාවක් තිස්සේ දරන ලද උත්සාහයක ප්‍රතිඵලයක් බවය. 1917 විප්ලවය සඳහා අත්‍යවශ්‍ය වූ බුද්ධිමය පදනම් සැබවින්ම පිහිටුවන ලද්දේ, සිය අරමුන ධනවාදී පාලනය අවසානයකට ගෙන ඒමට සවිඥානකව කැප කරන ලද දේශපාලන න්‍යායවාදීන් හා විප්ලවවාදීන් විසිනි. විප්ලවකාරී ප්‍රවාහය ශක්‍ය දෙයක් බවට පත් කල හා එය සුපෝෂනය කල ගංගා හා අතු ගංගා සංඛ්‍යාවෙන් අති විශාලය. ඒවා,

අන්තර් ක්‍රියාකාරී, ප්‍රතිවිරෝධී හා එකක් අනෙක ප්‍රතිශක්තිකරනය කල බලපෑමේ සංකීර්න පද්ධතියකි.

දශක නැත්නම් සියවස් ගනනක් තිස්සේ ගොඩනැගුනු හුරු පුරුදු, සුපුරුදු හැසිරීම් හා අගතීන් පසෙක ලා, පැරනි සමාජය බිඳ විසුරුවාලීමේ සවිඥානක ක්‍රියාවලියක් සඳහා මහත් ජනසමූහයන්ට නැඟී සිටීම සඳහා හදිසියේ ම හැකියාව ඇතිකල වාතාවරනයක් නිර්මානය කලේ, නොවැලැක්විය හැකි පරිද්දෙන් ඔවුන්ගේ ජීවිත වසා සිටි අගතීන්, හුරු පුරුදු හා හැසිරීම් රටාවන්ට ප්‍රතිරෝධය පෑමේ ආවේනික යයි පෙනෙන්නට ඇති ඔවුන් ප්‍රදර්ශනය කල ස්වාධීන බලය මඟිනි. මෙම ඓතිහාසික කුසීතභාවය අභිබවා යමින් නැඟී සිටීමේ වාතාවරනයක් නිර්මානය කිරීමේ හැකියාව හුදෙක් දේශපාලන කර්තව්‍යයක් ලෙස පිලිසිඳ ගත නොහැකි ය.

හැම අතින් ම සමාජවාදී වූ මිනිසෙක් වැඩි ඈතක නොවන බව අප විශ්වාස කරන, අනාගතයේ නිමැවුමක් බව අපි හඳුනා ගත්තෙමු. මෙය වනාහි, සමාජවාදී විප්ලවය යථාර්ථයක් බවට පත්වීමට පෙර ජන සමූහයන්ගේ හදවත් හා සිතුවිලිවල වෙනස්කම් අවශ්‍ය නොවන බව කියා සිටින ඒ අදහස නො වේ. අප ජීවත් වන්නේ සංස්කෘතික වශයෙන් එකතැන පල්වීමේ හා පිරිහීමේ යුගයකය. මේ තුල තාක්ෂනික ඓශ්චර්යයන් මූලිකව ම යොදාගන්නේ ජන සමූහයන් හිරිවට්ටා, නිද්‍රෝපගත කිරීමේ උත්සාහයක් ලෙස හා ඔවුන් අතිශය පසුගාමී සංකල්ප හා මනෝගතීන්ට ගොදුරු කර ගත හැකි තැනකට ඇද දැමීමට ය.

බොරුවෙන් සත්‍යය, අනවශ්‍ය දෙයින් අවශ්‍ය දෙය, ඔවුන්ගේ මාරක සතුරන්ගේ අවශ්‍යතාවන්ගෙන් තමන්ගේම මූලික අවශ්‍යතා වෙන්කර ගැනීමෙහි ලා, සාමූහික කුසලතා පෙන්නුම්කරන ජනගහනයේ තීරනාත්මක අභියෝග්‍යතා තියුනු කර හා ඔවුන්ගේ අධ්‍යාත්මික මට්ටම, ජන සමූහයන් සිය උදාරත්වය, දැවැන්ත කැප කිරීම්, සිය පිරිමි හා ගැහැනු සහකරුවන් ගැන පමනක් සිතන තැනකට ඔසවාලනු ඇත. මේ සියල්ල පැන නඟින්නේ සමස්තයක් ලෙස මානව සංස්කෘතියේ හා ජයග්‍රහනයන්හි නිමැවුමක් වන බුද්ධිමය සදාචාරාත්මක වර්ධනයෙන් ය.[140]

## මතු සම්බන්ධයි

## සටහන්

[116]. *ලෝක ධනවාදයේ අර්බුදය සහ හතරවන ජාත්‍යන්තරයේ කර්තව්‍යයො*, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ඉදිරි දර්ශන යෝජනාව 1988 අගෝස්තු, කම්කරු මාවත ප්‍රකාශන, පි. 19.
[117]. එම,
[118]. එම, පි. 3.
[119]. එම, පි.
[120]. 1988 හතරවන ජාත්‍යන්තරය සඟරාවේ ජූලි-දෙසැම්බර් කලාපයේ පලවූ, වර්කර්ස් ලීගයේ 13 වන ජාතික සමුලුවට ඩී. නෝර්ත්ගේ වාර්තාව, 38-39 පිටු.
[121]. එම, 7-8 පිටු.
[122]. ලියොන් ට්‍රොට්ස්කි, පාවාදුන් විප්ලවය, 235 පිටුව.
[123]. "කම්කරු රාජ්‍යය, තර්මිඩෝරය හා බොනපාට්වාදය" ට්‍රොට්ස්කිගේ ලියවිලි 1934-35(නිව් යෝරක්, පාත් ෆයින්ඩර්, 2002. 246වන පිටුව.
[124]. පෙරෙස්ට්‍රොයිකාවෙන් එපිටට - ගොර්බචෙව්ගේ සෝසසසංයේ අනාගතය. (1989 ලංඩන් වර්සෝ )11 වන පිටුව
[125]. තරික් අලි, *Revolution From Above: Where Is the Soviet Union Going?* සෝවියට් සංගමය කොයිබටද? ලංඩන්, හචිංසන් 1988, vi පිට.
[126]. එම, xi පිටුව
[127]. එම, xii පිට.
[128]. එම, xiii පිට.
[129]. *අප රක්නා උරුමය;* කම්කරු මාවත ප්‍රකාශන, දෙවන කොටස, පි. 699.
[130]. *ලෝක ධනවාදයේ අර්බුදය හා හතරවන ජාත්‍යන්තරයේ කර්තව්‍යයෝ, 1988* පි. 12-13.
[131]. හතරවන ජාත්‍යන්තරය, වෙලුම 19, අංක 1, 1992, පි.109.
[132]. ඩේවිඩ් නෝර්ත්, . සෝවියට් සංගමයේ අවසානය, ඩෙට්රොයිට් කම්කරු ප්‍රකාශන, 1992, 6 පිටුව.
[133]. එම 20 පිටුව.
[134]. මාටින් මාලියා, *The Soviet Tragedy: A History of Socialismin Russia,1917 1991,* සෝවියට් ඛේදාන්තය, රුසියාව තුල සමාජවාදයේ ඉතිහාසය. 1917-1991, නිව් යෝර්ක් ෆ්‍රී ප්‍රෙස් 1994, 23 පිටුව.
[135] *On History*, ඉතිහාසය මත යන කෘතියෙහි එන "රුසියානු විප්ලවය පිලිබඳ ඉතිහාසය අපට ලිවිය හැකිද", (ලන්ඩන්, වේඩෙන්ෆීල්ඩ් හා නිකල්සන්, 1997) 248 පිටුව.
[136]. එම 249 පිටුව.
[137]. ලියෝන් ට්‍රොට්ස්කි හා 20 වන සියවසේ සමාජවාදයේ ඉරනම, *ලෝක සමාජවාදී වෙබ් අඩවිය.* http://www.wsws.org/exhibits/trotsky/trlect.html
[138]. දිමිත්‍රි වොල්කොගොනොව්, *Lenin*, ලෙනින්, නිව් යොර්ක් ෆ්‍රී ප්‍රෙස්, 1994, 30 වන පිටුව.
[139]. "මාක්ස්වාදය සඳහා අරගලය හා හතරවන ජාත්‍යන්තරයේ කර්තව්‍යයෝ." 1992 මාර්තු 11 ඩේවිඩ් නෝර්ත්ගේ වාර්තාව. හතරවන ජාත්‍යන්තරයේ 19 වන වෙලුම, අංක 1: 74 පිටුව.
[140]. සමාජවාදයේ සෞන්දර්ය විද්‍යාමය අංශය, බැන්ක්ස්ටවුන් නිව් සවුත් වේල්ස්, මේරිංග්ස් පොත් ප්‍රකාශන, 1998- 35-37 පිටු.

© www.wsws.org